# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,590 — 1958 නොවැම්බර් 21 වැනි සිකුරාදා — 21.11.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV වැනි කොටස—පලාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | | | පිට |
|---|---|---|---|
| පලාත් පාලන නිවේදන | ... | ... | 993 |
| තනතුරු-ඇබෑර්තු | ... | ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | ... | ... | — |
| අතුරු ව්‍යවස්ථා | ... | ... | 1017 |
| පලාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ | | ... | — |
| අය වැය ලේඛන | ... | ... | — |
| දේපල විකිණීම | ... | ... | — |
| මාර්ග කොමිටි දැන්වීම් | ... | ... | — |
| විවිධ දැන්වීම් | ... | ... | 1023 |


## පලාත් පාලන නිවේදන

### 1939 යේ අංක 61 දරණ පලාත් ආණ්ඩු සභා ආඥාපණත

පලාත් පාලක සහකාර කොමසාරිස්වර පී. කේ. දිසානායක මහතා 1958වේ දෙසැම්බර් මස 1 වැනි දින සිට වැලිගම නගරයේ කටයුතු පාලනය කිරීමේ විශේෂ කොමසාරිස්වරයා වශයෙන් පත්කරන්ට යෙදුණ බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන පලාත් පාලන කොමසාරිස්තැන.

1958වේ නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹදීය.

---

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. ඩී. ජීඊ. 14/8.

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දිනය හා 9,773 වැනි අංකය දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් සංශෝධනය කරන ලද එකී වගන්තියෙන් පලාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹදීය.



**රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා**

1. (1) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථ වාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයේ තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම, සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාර විස්තරයක් සභාපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම උපලේඛණය කාර්‍ය සහා කාර්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින්, 1959 වර්ෂය වෙනුවෙන්, 1 වැනි ඡේදයේ සඳහන් කොට ඇති උපලේඛනය සම්පූර්ණ කොට 1959 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධාන තුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලන යෙහි තබා ගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලෙඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලෙඛනය සැපයුවාවූ සෑම අයෙක් ම නව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලෙඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහා වූ බද්ද, 1959 මේ අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස් එක් වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති. තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් තිහකට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස් එක් වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම් කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ද ආඥාපණත යටතේ බද්දට යටත් වූ ද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කර ගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තා වූ යම් කිසිවකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමු වරට අත්පත් කර ගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම්, එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබා ගැනීමේ හෝ පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක් මාසයක් ඇතුළතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ල කින් වූ දැන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය සැපයුවා වූ සැම අයෙක්ම, එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාලසීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන්වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපණතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සැම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් හේතු නිසායයි දැක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමා වෙත යැවිය යුතුය.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියා වූ සැම අයෙකු විසින්ම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිති වාසිකම් අත්හල බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උප ලේඛනයෙහි සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරු ද, තහඩුව නිකුත් කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථ වාහනය පිළිබඳවූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නො පැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ඒ ප්‍රධානතුමාට ආපසු භාර දිය යුතුයි. තවද, ඔහු විසින් ශත පණහක් ගෙවූ විට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරා ගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙන යම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිති කාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විට අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සැම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින්, 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවි කළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ ආදායම් ඕවර්සියර් වරයෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂා කර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යනුකූල වන්නේය. තවද, ප්‍රධාන තුමා විසින් හෝ එකී ඕනෑම නිලධාරියෙකු විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ රථය පද වන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩ දිය යුතුයි.

9. කාර්ය සභාව විසින් සම්පාදිතව, 1941 සැප්තැම්බර් 26 වැනි දින අංක 8,796 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍යසභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ මහර ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපණත" යනුවෙන් ගම්සභා ආඥාපණත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### මහර ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා වල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකරුගේ නම :————.
ඡන්දදායක කොට්ඨාශය :————.
ගම :————.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බරකරත්ත හෝ තිරික්කල් ... | | |
| තනි ගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල් | | |
| අත් කරත්ත ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරයේ සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) | | |
| අලි ... | | |
| අශ්වයෝ ... | | |
| අශ්වතරයෝ ... | | |
| ඌරුවෝ ... | | |

* නුවුමනා වචන කපා දමනු.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මින් ප්‍රකාශ කරමි.

————,
අයිතිකරුගේ අත්සන.

දිනය :————.

## "බී" උපලේඛනය

| | | |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන සඳහා | ... | ම.ග.වා. |
| ඕනෑම අන්දමක සැම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... | ම.ග.ක. |
| සැම තනි ගොනා බඳින කරත්තයක්, තිරික්කලයක් හෝ අත් කරත්තයක් සඳහා | ... | ම.ග.බා. |
| සැම බයිසිකලයක් සඳහා ... | ... | ම.ග. බ. |
| සැම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා | ... | ම.ග. රි. |

ජීබී. 14/10/12.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළ වූ ප්‍රකාශනයෙන් සංශොධිත එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් 7 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1956යේ පෙබරවාරි මස 3 වැනි අංක 10,889 දරණ ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථාවෙන් අවසාන වරට සංශොධිතවූ, 1949යේ ඔක්තෝබර් මස 20 වැනි දින අංක 10,034 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා, එහි 141 වැනි අතුරු ව්‍යවස්ථාව අස්කොට ඒ වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව යෙදීමෙන් නාවි දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"141 කිසියම් ගම්බද වෙළඳපොළක යම් ස්ථානයක් පාවිච්චි කිරීම හෝ එහි පදිංචිවීම හෝ සඳහා පහත දැක්වෙන ගණන් අනුව ගාස්තු වක් අය කළ යුතුවාක් මෙන්ම ගෙවිය යුතුද වන්නේය. එනම් :—

| | |
|---|---|
| එක්දිනකට එක් කඩබක්කියක් සඳහා | රුපියල් 1 00 |
| එක්දිනකට භූමිභාගයේ හතරැස් යාර එකක් සඳහා | .50 |

ඇල්. ජී.සී.—ජීසී. 14/27.

### ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම් ප්‍රදේශයේ ගම් කාර්ය සභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වෙනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958ක්වූ නොවැම්බර් මස 14 වැනි දින,
කොළඹදීය.

#### අතුරු ව්‍යවස්ථාව

1941ක්වූ ජූනි මස 6 වෙනි දින අංක 8,751 දරණ ගැසට් පත්‍රයේ පළකරනලද රථ වාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා, ඊට යාකොට ඇති උපලේඛනය අස්කොට ඒ වෙනුවට පහත සඳහන් අළුත් උපලේඛනය යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" උපලේඛනය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර ඕනෑම අන්දමක සෑම වාහනයක් සඳහා ... | පොතු.ග. ස. වා. |
| ගොන් දෙන්නා බඳින ඕනෑම අන්දමක සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | පොතු. ග. ස. ක. |
| තනි ගොනා බඳින සෑම බරබාග කරත්තයක් හෝ අත් කරත්තයක් සඳහා ... | පොතු.ග.ස.බාක. |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... | පොතු. ග. ස. ජි. |
| සෑම බයිසිකලයක් සඳහා ... | පොතු. ග. ස. පා." |

---

ඇල්.ජී.සී.—ජීසී. 14/10.

### ගම් සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පලාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය
කාර්යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1958 නොවැම්බර් 12 දින,
කොළඹ.

#### අතුරු ව්‍යවස්ථා

**අප්‍රසන්නවූ හා අන්තරායදායකවූ කර්මාන්ත**

1. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ කර්මාන්ත වශයෙන් සළකනු ලැබේ:—

(1) ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
(2) මිරිස් සහ වෙනත් කුළුබඩු වර්ග යන්ත්‍රානුසාරයෙන් ඇඹරීම.
(3) කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.
(4) විනාකිරි සෑදීම.
(5) සබන් සෑදීම.
(6) පුවක් වියලා සකස් කිරීම.
(7) සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම.
(8) ලැලි පොඟවා සකස් කිරීම.
(9) රබර් සීට් දුම්ගැස්සීම හෝ සෑදීම.
(10) කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
(11) සුරුට්ටු සෑදීම.
(12) බීඩි සෑදීම.
(13) පැණි හකුරු සෑදීම.

2. පහත දැක්වෙන කර්මාන්ත අන්තරාදායකවූ කර්මාන්ත වශයෙන් සළකනු ලැබේ:—

(1) කෝප්පරා සෑදීම.
(2) කබුක්ගල්, බොරළු හෝ කලුගල් ලබාගැනීමට ගල්වලවල් කැපීම.
(3) කපාපු පොල් වියලා සකස් කිරීම.
(4) කොප්පරා ගබඩා කිරීම.
(5) මිනිරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම.
(6) යන්ත්‍රානුසාරයෙන් හෝ සෙක්කුවලින් පොල්තෙල් සිඳීම.
(7) කෙඳි වර්ග තෙලීම සහ ගබඩා කිරීම.
(8) කපු පුළුන්, හුල් ආදිය ගබඩා කිරීම.
(9) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම.
(10) මුද්‍රණ යන්ත්‍රාලයක් තබාගැනීම්.
(11) තේ කර්මාන්ත ශාලාවක් තබාගැනීම.
(12) රබර් කර්මාන්ත ශාලාවක් තබා ගැනීම.
(13) හාල් වී මෝලක් තබා ගැනීම.
(14) ලී ඉරණ මෝලක් තබාගැනීම.
(15) බයිසිකල් අළුත් වැඩියා කිරීම සඳහා වූ ස්ථානයක් තබාගැනීම.
(16) මෝටර් රථ අළුත්වැඩියා කිරීම සඳහා වූ ස්ථානයක් තබාගැනීම.
(17) අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කිරීම.
(18) ගෘහ භාණ්ඩ සෑදීම.
(19) පිදුරු ගබඩා කිරීම.
(20) ගල් හෝ පාරවලට දමන ගල් කැඩීම.
(21) රබර් ගබඩා කිරීම.
(22) ගිනිකෙළි භාණ්ඩ සෑදීම.
(23) උපකරණ මාර්ගයෙන් කොහු හෝ කඹ සෑදීම හෝ ඇඹරීම.
(24) ගිනිපෙට්ටි සෑදීම.

3. පහත දැක්වෙන කර්මාන්ත අප්‍රසන්නවූ හා අන්තරාදායකවූද කර්මාන්ත වශයෙන් සළකනු ලැබේ.

(1) කෙඳි සායම් කිරීම.
(2) බැටරි චාජ් කිරීම.
(3) ගඩොල් හෝ උළු පිළිස්සීම.
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කුඩා කැබලිවලට කැඩීම.
(5) අඟුරු සඳහා පොල්කටු පිච්චීම.

**ඇවිද බඩු විකුණන්නෝ**

4. ප්‍රධානතුමා විසින් ඒ සඳහා නිකුත්කරන ලද බලපත්‍රයක් පිට මිස නැත්නම් කිසිවෙකු විසින් ඇවිද බඩු විකුණන්නෙකු වශයෙන් එළවළු, පළතුරු, අළුත්මාලු හෝ මස් වෙළඳාම කරගෙන යාම නොකළ යුතුයි.

5. 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරනලද අවුරුද්දේ දෙසැම්බර් මස තිස්එක් වෙනිදට අවසාන වන්නේය.

**ආහාර ද්‍රව්‍ය විකිණීම**

6. කාර්ය සභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල XIII වැනි කාණ්ඩයේ පෙනෙන්ට ඇති ආහාර ද්‍රව්‍ය විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) 1 වැනි හා 3 වැනි අතුරු ව්‍යවස්ථාවල "මාලු" යන වචනය අස්කොට ඒවෙනුවට "මාලු, හාල්, කුළුබඩු" යන වචන යෙදීමෙන්, හා

(2) 2 වැනි අතුරු ව්‍යවස්ථා වේ—

(අ) "මාලු, එළවලු" යන වචන අස් කොට ඒ වෙනුවට, "මාලු, කුළුබඩු, හාල්, එළවලු" ආදී වචන යෙදීමෙන්, හා

(ආ) "එළවලු හැර" යන වචන අස්කොට ඒ වෙනුවට "හාල්, කුළුබඩු හා එළවලු හැර" යන වචන යෙදීමෙන් ද වේ.

**අශූචි ඉවත් කිරීම හා කසළ ශෝධනය**

7. (1) කාර්ය සභාව විසින් සම්මත කරගන්නාලද අශූචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කාණ්ඩයේ දැක්වෙන කාරණා සඳහා කාර්ය සභාවට ගෙවිය යුතු අශූචි ඉවත් කිරීමේ මාසික ගාස්තුව, එක් එක් බාල්දිය සඳහා රු. 2 ගණනේ වියයුතු වන්නේය.

(2) කාර්ය සභාව විසින් සම්මතකර ගන්නාලද අශූචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි කාණ්ඩයේ දැක්වෙන කාරණා සඳහා කාර්ය සභාවට ගෙවිය යුතු කසළ ශෝධන මාසික ගාස්තුව **සත විසිපහක්** වියයුතු වන්නේ ය.

**වැසිකිළි සෑදීම**

8. (1) අසවල් ප්‍රදේශයතුල මිනිසුන් වාසය කරන ඕනෑම දේපලක අයිතිකාරයා විසින් හෝ බදු කාරයා විසින් වැසිකිළියක් සාදා පවත්වා ගෙන යායුතු යයි කියා, කාර්යසභාව විසින් යම් ප්‍රදේශයක සීමා නියම කර තිබෙන කවර විටෙකදීවුවත්, ප්‍රධානතුමා විසින් එකී අයිතිකාරයා වෙත හෝ බදුකාරයාවෙත භාරකරනු ලබන ලියවිල්ලකින්වූ දැන්වීමකින් ඒ දැන්වීමේ සඳහන්කරනු ලබන වර්ගයක හා ප්‍රමාණයක වැසිකිළියක් කාර්ය සභාව විසින් තීරණය කොට ඇති ප්‍රකාරයටවූ නියමයන්ට එකඟවද කාණු ආදිය සම්බන්ධකොටද, ඒ දේපොලේ අසවල් ස්ථානයේ සාදන්ට ඕනෑයයි අණකළ හැකිය.

(2) (1) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාරකරනු ලැබූ සෑම දේපල හිමියෙකු විසින් හෝ බදුකාරයෙකු විසින්ම තමාට ඒ දැන්වීම භාරදුන් දින සිට දවස් තිහක් ඇතුලතදී හෝ ප්‍රධානතුමා විසින් ඊට ඉඩදෙනු ලබන යම් අතිරේක කාල සීමාවක් ඇතුලත දී හෝ සෑම අතින්ම ඒ දැන්වීමේ දක්වා ඇති නියමයන්ට එකඟව වැසිකිළියක් සෑදිය යුතුයි.

9. ප්‍රධානතුමාගෙන් අවසරය නැතුව කිසිවෙකු විසින් කිසිම ළිඳක සිට අඩි සියයක දුරප්‍රමාණය ඇතුළත වැසිකිළිවලක් සෑදීම හෝ තඩත්තු කිරීම හෝ නොකට යුතුයි.

### නිලධාරීන් හා මෙහෙකරුවන්

10. කාර්‍ය්‍ය සභාවට එන්ට තිබෙන සියලුම අයබදු හා ගාස්තු එකතු කොට කාර්‍ය්‍ය සභාවේ මුද්‍රාව හා ප්‍රධානතුමාගේ අත්සනේ නිවැරදි පිටපත ඇති මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීම පිණිස ප්‍රධානතුමා විසින් ඕනෑම නිලධාරියෙකුට හෝ වෙනත් කෙනෙකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

11. කිසිවකු විසින්—

(ඒ) ගම්සභා ආඥාපණතෙන් හෝ ඒ ආඥාපණතේ හෝ එය යටතේ සාදනා ලද යම් අතුරු ව්‍යවස්ථාවල හෝ යම් විධිවිධානයක් යටතේ හෝ ප්‍රධානතුමාට හෝ කාර්‍ය්‍ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකුට පැවරී ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පණවා ඇති යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී හෝ නියමකොට ඇති යම් කාර්‍ය්‍යයක් ක්‍රියාවේ යෙදවීමේදී හෝ එකී ප්‍රධානතුමාට හෝ නිලධාරියාට, හෝ

(බී) කාර්‍ය්‍ය සභාවෙන් හෝ කාර්‍ය්‍ය සභාව වෙනුවෙන් හෝ රක්ෂාවට යොදා ගන්නාලද යම් මෙහෙකරුවෙකුට හෝ වැඩකාරුවෙකුට ප්‍රධානතුමා විසින් හෝ කාර්‍ය්‍ය සභාවේ වෙනත් යම් නිලධාරියෙකු විසින් හෝ නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඉෂ්ට කිරීමේදී ඒ මෙහෙකරුවාට හෝ වැඩකරුවාට, හෝ

ඕනෑකමින් බාධා නොකළ යුතුයි.

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

12. (1) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ මේ රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාර විස්තර උපලේඛනයක්, සභාපතිතුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්‍ය්‍ය සභා කාර්‍ය්‍යාලයෙන් ලබාගත හැකිය.

(2) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින්, 1959 වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනය සම්පූර්ණ කොට 1958 දෙසැම්බර් මස තිස් එක් වෙනි දිනට හෝ ඊට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන්වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

13. ආඥාපණතේ 47 (2) වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 12 වෙනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව—

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහාවූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු මස තිස්එක් වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති, තවද,

(ආ) ඊට පසු එක් එක් වර්ෂයවෙනුවෙන් ඒ උපලේඛනයේ අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නා වූ එකී රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු මස තිස්එක්වෙනිදාට හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති.

14. 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයූවාට පසු යම් කිසිවකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දවූද ආඥාපණත යටතේ බද්දට යටත් වූද යම් රථ වාහනයක් හෝ සතෙකු අත්පත්කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් හෝ 12 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම්, එවිට ඒ අය විසින් එබඳු රථවාහනයක් හෝ සතෙකු අත්පත්කර ගැනීමේ හෝ තබාගැනීම නොහොත් පාවිච්චි කිරීමට පටන්ගැනීමේ දින සිට මාසයක් ඇතුලතදී සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් කොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් ෆෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දැන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධානතුමාට දැන්විය යුතුයි.

15. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව. 14 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක්ම, එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සෑම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛණයේ සඳහන් කරුණු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනයේ සිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම්කාල සීමාවක් ඇතුලතදී ගෙවීමට බැඳී සිටිති.

16. (1) 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 14 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින්වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ උපලේඛනයට ඇතුලත්කළා වූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන්වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපණතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින් එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතු නිසා යයි දැක්වෙන ලියවිල්ලකින්වූ දැන්වීමක් වහාම ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි.

(2) 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 14 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයූවාට පසු ඒ රථවාහනයේ හෝ සතා තබාගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම අත්හැරියාවූ සෑම අයෙකු විසින්ම ලියවිල්ලකින්වූ දැන්වීමක්, තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතරකළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත්හල බව වහාම ප්‍රධානතුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

17. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූවිට ප්‍රධානතුමා විසින් ඒ බද්ද ගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන්කොට ඇති "බී" උපලේඛනයේ ප්‍රකාරයට ඒ ඒ රථවාහන සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුව නිකුත්කරන අවුරුද්ද දැක්වෙන ඉලක්කම්ද, රථවාහන රෙජිස්ටරයේ ඒ ඒ රථවාහනය පිළිබඳවූ අංකයද සටහන්කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙන යම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකීගොස් තිබෙනහොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් සත පණහක් ගෙවූවිට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබාගැනීමට අයිතිවාසිකම් තිබේ.

18. සෑම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින්, 17 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත්කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනෙක සවිකළ යුතුයි.

19. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම නිළධරයෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයෙහි යෙදී තිබෙන රථ වාහනයක්, ඒ රථවාහනයෙහි 18 වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබියයුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධානතුමා විසින් හෝ නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ ඒ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

20. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය්‍ය සභාව" යනුවත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපණත" යනුවෙන් ගම්සභා ආඥාපණත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

21. 1947 ජූනි 20 වැනි දින අංක 9,720 දරණ "ගැසට්" පත්‍රයේ පළවූ රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### ෆෝර්මය

#### වැඋඩ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාර සැපයිය යුතු රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකරුගේ නම :———.

වන්දදායක කොට්ඨාශ අංකය :———.

ගම :———.

| රථවාහන හා/හෝ* සතුන් පිළිබඳ විස්තර | ගණන වචනවලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක "කැරේජ්" රථ | | |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| තනිගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල ... | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරයේ සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

* නුවමනා වචන කපා දමනු

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

———————

අයිතිකරුගේ අත්සන.

දිනය :———.

### "බී" උපලේඛනය

| | | |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක රථවාහනයක් සඳහා | ... | වැ.ග.කැ.ර. |
| ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... | වැ.ග.බ.ක. |
| සෑම තනි ගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... | ... | වැ.ග.බා.ක. |
| සෑම ජින්රික්ෂෝ කරත්තයක් සඳහා ... | ... | වැ.ග.අ.ක. |
| සෑම ජින්රික්ෂෝ කරත්තයක් සඳහා | ... | වැ.ග.රි.ක. |
| සෑම බයිසිකලයක් සඳහා ... | ... | වැ. ග. බ. |

---

ඇල්.ඩී—බී. 43/58/ඇල්.ජී.ඩී.—ජිඒ. 11/59/10.

### සුසාන භූමි හා භූමිදාන කිරීම පිළිබඳ ආඥාපණත

වැල්ලවාය ගම්ප්‍රදේශයේ පාලනබල සීමාව ඇතුළත පිහිටි සුසානභූමි සඳහා ගම්සභා ආඥා පනතේ (198 වැනි පරිච්ඡේදයේ) 51 වැනි වගන්තිය සම්බන්ධකොට ගත් සුසාන භූමි හා භූමිදාන කිරීම පිළිබඳ ආඥාපනතේ (181 වැනි පරිච්ඡේදයේ) 38 වැනි වගන්තිය යටතේ විධිවූ බලමණ්ඩලය විසින්, එනම් වැල්ලවාය ගම්කාර්‍ය්‍යසභාව විසින් සම්පාදිතව, 1947 තේ සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ සුසාන භූමි හා භූමදාන කිරීම පිළිබඳ ආඥාපනතේ 39 වැනි වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් ස්ථිරකරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍ය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ.

#### අතුරු ව්‍යවස්ථා

1. මේ අතුරු ව්‍යවස්ථා යටතේ ලියාපදිංචි කරනු ලබන සියළුම සුසාන භූමි පිළිබඳ ලේඛනයක් කාර්‍ය්‍යසභාව විසින් තීරණය කරනු ලබන යම් ෆෝර්මයක ප්‍රකාරයට ප්‍රධානතුමා විසින් කාර්‍ය්‍යසභා කාර්‍ය්‍යාලයේ තබා ගතයුතුයි.

2. (1) මේ අතුරුව්‍යවස්ථා "ගැසට්" පත්‍රයේ පළකරන දිනයේදී වැල්ලවාය ගම්ප්‍රදෙශයේ ඇතුළත පිහිටා තිබෙන සෑම සුසාන භූමියකම අයිතිකාරයා විසින් එකී දින සිට මාස එකක් ඇතුළතදී එකී සුසාන භූමිය ලියාපදිංචිකරන මෙන් ඉල්ලා සිටිය යුතුයි.

(2) මේ අතුරු ව්‍යවස්ථා ගැසට් පත්‍රයේ පළකරන දිනයෙන් පසු ගම් ප්‍රදේශය ඇතුළත පිහිට වනු ලබන සෑම සුසාන භූමියකම අයිතිකරුවා විසින් එකී සුසාන භූමිය පිහිටුවීමෙන් මාසයක් ඇතුතදී එය ලියා පදිංචි කරන මෙන් ඉල්ලා සිටිය යුතුයි.

(3) සුසාන භූමියක් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම ලියවිල්ලකින් වියයුතුවාත් හැර එය අයිතිකාරයා විසින් අත්සන් කරනු ලැබ ප්‍රධානතුමා නමට එවියයුතුද වන්න්ය.

3. මිනිසුන් පදිංචි කිසියම් නිවසක සිට යාර සියයක් ඇතුළත දුරින් කිසිම සුසාන භූමියක් පිහිටුවිය යුතු නැත.

4. සුසාන භූමියක අයිතිකාරයා විසින් ප්‍රධාන තුමා තෘප්තිමත්වන පරිදි එය වටේ තාප්පයක් හෝ වැටක් බැඳ එම තාප්පය හෝ වැට මනා තත්ත්වයකින් තබාගත යුතුයි.

5. කිසිම මිනී වළක් ගැඹුරින් අඩි හතරහමාරකට අඩුව හෝ වෙනත් මිනී වළක සිට දුරින් අඩි 3 කට අඩුව හෝ කැපියයුතු නැත.

6. මෘත ශරීර භූමදාන කිරීමෙන් පසුව එය නැවත ගොඩගැනීමට නියමකිරීමට තරම් බලයක් ඇති අධිකාරී මණ්ඩලයක නියමයන් පිට මිස නැත්නම් කිසිවෙකු විසින් යම් මෘත ශරීරයක් භූමදාන කොට අවුරුදු තුනක් ගතවීමට පෙර එය වළලන ලද වළ නැවත විවෘත නොකළයුතුයි.

7. (1) ප්‍රධානතුමා විසින් ඒ සඳහා නිකුත්කරනලද අවසර පත්‍රයක බලය පිට මිස නැත්නම් කිසිවකු විසින් කිසිම සුසාන භූමියක කිසිම ස්මාරකයක් සෑදීම, සෑදීමට සැලැස්වීම හෝ නොකළයුතුයි.

(2) යම් කිසි ස්මාරකයක් සෑදීම සඳහා ඉඩදෙනු ලබන ප්‍රදේශය හතරැස් අඩි හතරකට වැඩි නොවියයුතුයි.

(3) 1 වැනි ඡේදයේ යටතේ නිකුත් කරනලද සෑම අවසර පත්‍රයක්ම ඊට අදාල ස්මාරකය සෑදීම සම්බන්ධයෙන් ඉඩදෙනලද බිම් ප්‍රමාණය මෙතෙකැයි සඳහන් කර තිබිය යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාර්‍ය්‍යසභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ,

"කාර්‍ය්‍යසභාව යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍යසභාව අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

"අයිතිකාරයා" යනුවෙන් සුසාන භූමියක භාරකාරයා, පාලකයා, අයිතිකාරයා හෝ සුසාන භූමියකට අයිතිවාසිකම් දක්වීමට හිමිකම් ඇති වෙනත් අයෙකු අදහස්කරනු ලැබේ.

---

# අය වැය ලේඛන

## වාද්දුව සුළු නගර සභාව

### 1958 අංක 1 දරණ අතුර වැය ලේඛනය

| වැය ශීර්ෂය | | | මුදල රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම— | | | | |
| 1. සේවකයින්ගේ වැටුප්— | | | | |
| (ඒ) ලේකම් ... | ... | ... | 879 | 0 |
| (බී) ලිපිකරුවන් ... | ... | ... | 150 | 0 |
| (ඩී) පියන්වරු ... | ... | ... | 150 | 0 |
| 2. කාර්‍ය්‍යමණ්ඩලයේ වියදම් | ... | | | |
| (බී) ගමන් ගාස්තු ... | ... | ... | 150 | 0 |
| (සී) බදු අයකරන්නන්ට කොමිස් | ... | ... | 700 | 0 |
| (ඩී) හදිසි වියදම් ... | ... | ... | 50 | 0 |
| (කේ) කාර්‍ය්‍යාල භාණ්ඩ හා උපකරණ | | ... | 700 | 0 |
| බී.—මහා මාර්ග— | | | | |
| (1) වෙතන හා දෛනික වැටුප් | ... | | | |
| (බී) ඕවර්සියර් වරුන්ට | ... | ... | 150 | 0 |
| (13) ජීවන හා විශේෂ ජීවනාධාර | ... | ... | 1,000 | 0 |
| සී.—නගරසභා ඉඩම් හා ගොඩනැගිලි— | ... | ... | | |
| (1) වේතන ... | ... | ... | 300 | 0 |
| (8) ජීවන හා විශේෂ ජීවනාධාර | ... | ... | 100 | 0 |
| ඩී.—සනීපාරක්ෂාව— | | | | |
| 1 (ඇෆ්) විෂබීජ නාශක ද්‍රව්‍ය | ... | ... | 100 | 0 |
| (ඕ) ජීවන හා විශේෂ ජීවනාධාර | ... | ... | 100 | 0 |
| 2. කසල සෝධනය— | | | | |
| (බී) කරත්ත ගොනුන් හා ලොරි | ... | ... | 500 | 0 |
| (ඊ) ජීවන හා විශේෂ ජීවනාධාර | ... | ... | 3,500 | 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | | | | |
| (බී) කරත්ත ගොනුන් හා ලොරි | ... | ... | 800 | 0 |
| (එච්) ජීවන හා විශේෂ ජීවනාධාර | ... | ... | 3,500 | 0 |
| **විදුලි බලය සැපයීමේ අංශය** | | | | |
| 1. විදුලි බලය උත්පාදනය— | | | | |
| (ඩී) විදුලිබලය මිලයට ගැනීම | ... | ... | 8,800 | 0 |
| 2. ප්‍රතිසංස්කරනය හා නඩත්තු කිරීම— | | | | |
| (සී) මාපක යන්ත්‍ර, ඇන හා අන් උපකරන | | ... | 150 | 0 |
| (ඩී) විදුලිබලය සැපයීමේ ප්‍රධාන කම්බි නඩත්තු කිරීම | | ... | 250 | 0 |
| 4. පාලන හා සාමාන්‍ය වියදම්— | ... | ... | | |
| (ඒ) පරිපාලක වේතන හා ආධාර | ... | ... | 800 | 0 |
| (ඩී) නානාප්‍රකාර වියදම් | ... | ... | 400 | 0 |
| | | | 23,229 | 0 |

1958 ජූනි මස 20 වෙනි හා 1958 ඔක්තෝබර් මස 31 වෙනි දිනවල සභාවේ පැවැත්වූ සාමාන්‍ය රැස්වීම් වලදී සහා සම්මුතියෙන් තීරනය කරගනු ලැබීය.

ඇම්. ඩී. ඩී. ගුණතිලක,
සභාපතිතැන.

නගර සභා කාර්‍ය්‍යාලය,
නොවැම්බර් 7, 1958.

අනුමත කරනලදී.

ටී. ඩී. විජයරත්න,
වැඩබලන පළාත්පාලන කොමසාරිස්තුමා වෙනුවට.

1958 නොවැම්බර් මස 15 වෙනි දින,
කොළඹදීය.

# විවිධ දැන්වීම්

## මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬව ගඟබඩ පත්තු ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬවන්නේ අසවල් කරුණ සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩී. ඒ. කන්නන්ගර,
ගඟබඩපත්තු ගම්කාර්ය සභාවේ
ප්‍රධානතැන.

ගම්කාර්ය සභා කාර්යාලය,
වෙල්ගම-බුලත්සිංහල, 1958.11.11.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. සී. ඇල්. ඇම්. කාලිඳු. පොකුණු විට | හල්වතුර, හරක් මස් |
| 2. ඇන්. ඇල්. අබ්දුල් රසීද්, බණ්ඩාරගම | අතුර, හරක් මස් |
| 3. ඒ. ඇල්. ඇම්. මවුරූප්, වේයන් ගල්ල | වේයන්ගල්ල, හරක් මස් |

---

## කන්ද පල්ල කෝරළේ ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අයවළුන් එහි සඳහන් ස්ථානවල 1959, වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස බල පත්‍ර ඉල්ලා ඉල්ලුම් පත්‍ර මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (201 වැනි පරිච්ඡේදයේ) 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපණතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරනලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන කන්ද පල්ල කෝරළේ ගම් ප්‍රදේශයේ ගම්කාර්ය සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුඬ වන්නේ නම් ඔහු හෝ ඈ එසේ විරුඬ වන්නේ කුමන හේතුන් නිසා ද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට මාසයක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඒ. ඇම්. සාවෙල් හමිදු. නාඹඩගහවත්ත, ගලේවෙල | නාඹඩගහවත්තේ, ඉඟිණිගහමූල වත්ත, හරක් මස් කඩයක්. |
| 2. ඇස්. මොහම්මදු රාජන්, නාඹඩගහවත්ත, ගලේවෙල | නාඹඩගහවත්තේ, දික්යායේ වත්ත, හරක්මස් කඩයක්. |

ඊ. ඇම්. බී. රත්නායක,
කන්ද පල්ල කෝරළේ ගම්කාර්ය සභාවේ
ප්‍රධානතැන.

1958ක් වූ නොවැම්බර් මස 21 වැනි දින,
ගලේවෙලදීය.

---

## දෙහිගම්පල් කෝරලේ සහ පහත බුලත්ගම ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලෙඛණයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම ගම්කාර්යසභා ප්‍රදෙශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම්දෙමි.

ඩී. ඇම්. ද සිල්වා,
දෙහිගම්පල් කෝරළේ සහ පහත බුලත්ගම
ගම්කාර්යසභාවේ ප්‍රධානතැන.

1958ක් වූ නොවවැම්බර් මස 14 වැනි දින,
ගම්කාර්ය සභා කාර්යාලය,
රුවන්වැල්ල.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| පී. අබ්දුල් කපූර්, කන්නත් තොට | අංක 169, මහවත්ත, කන්නත් තොට, ගව සහ එළුමස් |

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ කනෝගම ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1958වේ වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬව කුරුණෑගල දිස්ත්‍රික්කයේ කනෝගම ගම්කාර්ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ නිසාය යි සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම් ගැසැට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947තේ අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම්දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. මුහම්මදු ජුනෛසිදීන් අබ්දුල් මජීඩ්, බණ්ඩාරකොස්වත්ත. | බණ්ඩාරකොස්වත්ත යන ගමේ, පිහිටි කැලඹගහමූල වත්ත නොහොත් ගන්සූරිය ගහමූල යන ඉඩමේ නොම්මර 111 දරණ ස්ථානයේ කඩේ ගවමස් වෙළඳාම. |

ජේ. බී. රාජපක්ෂ,
සභාපතිතැන.

1958 නොවැම්බර් 13 වැනි දින,
කනෝගම ගම්කාර්ය සභා කාර්යාලය,
බණ්ඩාරකොස්වත්ත.

---

## හලාවත දිස්ත්‍රික්කයේ—යටකලන්පත්තු ගම්කාර්ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවළුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම්කාර්ය සභා සීමාප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහායැයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. ඒ. ඇම්. ඇල්පේනිස් අප්පුහාමි, වීරහේන, මාරාවිල | හරක්මස්, එළුමස් හා ඌරු මස්, හොරගොල්ල මංසන්ධිය |
| 2. වර්ණකුලසූරිය ප්‍රන්සිස් ප්‍රනාන්දු දකුණු තොඩුවාව, මහවැව | හරක්මස්, එළුමස් හා ඌරු මස්, මට්ටාකොටුව |

ඩබ්ලිව්. ඩබ්ලිව්. මැතිව් ප්‍රනාන්දු,
ගම්කාර්ය සභාපති.

ගම්සභා කාර්යාලයය,
හත්තිනිය-මාරාවිල,
13 නොවැම්බර් 1958.

## හේවාවිස්ස කෝරළේ ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1959යේ වර්‍ෂයේ මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බැවින් මෙම බල පත්‍රය නිකුත් කිරීම ගැන හේවාවිස්ස කෝරළේ ගම්කායයී සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුඬ වන්නේ නම් ඒ කුමන කරුණු නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වෙනි පරිච්ඡෙදයේ අංක 7 සහ 1947 අංක 44 දරණ ආඥාපණතින් සංශොධිතවූ අංක 4 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. ඇස්. ඇම්. මොහමඩ් ඔසේන්, දෙල්තොට | දෙල්තොට කඩවීදියේ හරක් මස් විකිණීම |
| 2. ඇස්. ඇම්. මොහමඩ් ඔසේන්, දෙල්තොට | දෙල්තොට කඩවීදියේ එළු මස් විකිණීම |
| 3. ඇස්. අමීර්දීන්, උඩුදෙනිය, මාරස්සන | උඩුදෙනිය ගමේ හරක් මස් විකිණීම |

කේ. බී. වික්‍රමසිංහ,
හේවාවිස්ස කෝරළේ ගම්කායයී සභාවේ සභාපති තැන.

1958ක් වූ නොවැම්බර් මස 12 වැනි දින,
මාරස්සන පිහිටි
හේවාවිස්ස කෝරළේ ගම්කායයී සභා කායයීාලයේ දීය.

## විශෙෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.